34 වන පිටෙන්

ගමනට ගුවන් ප්‍රවේශපත්‍ර ගෙනාවෙ දකුණු අප්‍රිකාවෙ ඉදන් සුදු කාන්තාවක්. කටුනායක ඉඳන් හොංකොං යන්න. හොංකොං වලදි දකුණු අප්‍රිකානු ඒජන්තවරයෙක් මේ අයට දෙනවා. තායිපේට යන්න. ඊට පස්සෙ තායිපේ ඉදන් ජොහැන්ස්බර්ග් වලට කට්ටිය යනවා.

පාලක මණ්ඩලයේ ඒකාධිපති වියරුව දරා ගත නොහැකිවූ බන්දුල, ඉහත සඳහන් කළ ක්‍රිකට් ආයතනයේ පාලකයකුගෙ නම බෝඩ් කෑල්ලක ලියල බල්ලෙක්ගෙ කරේ එල්ලල බ්ලූම්ෆීල්ඩ් තරගයක් අතරතුරදි පිට්ටනිය වටේ යැව්වා. බල්ලා හරහා ඒකාධිපතිගේ නම බල්ලට දැම්මා. පස්සෙ ඒ පුද්ගලයා ප්‍රකාශ කර තියෙනව වර්ණපුරගෙ ගෙදර තිබුණ පාටියකදි එයාගෙ පියාට, පුතාට නායකකම කරන්න ඕනනම් බ්ලූම්ෆීල්ඩ් එකෙන් අයින් වෙන්න කියලා. මේ හේතු නිසා තමයි ඔය ගැටලුව ඇති වෙලා තිබුණෙ කියල පාලිත ලිව්වා. මේ තරගාවලියට යන්නෙ නැහැ කියල බොරු නිව්ස් එකකුත් ටෝනි ඕපාත ඔය අතරේ පත්තරේ දැම්මා. එතකොට කට්ටියගෙ අවධානය වෙන පැත්තකට යන හින්ද තමයි එහෙම දෙයක් කළේ. ඊට පස්සෙ දෙන්නා එකට තමයි

**මගේ මතකයට අනුව එදා අපි ක්‍රිකට් තරගයක් රූපවාහිනියෙන් නරඹන විට එහි හඬ නවත්වා පාලිත පෙරේරාගේ කට හඬ ගුවන් විදුලියෙන් අසා තරගයේ උපරිම ආශ්වාදය වින්දෙමු. ඒ තරමට ඔහුගේ ක්‍රිකට් විචාරය අපේ හදවතට දෝංකාර ගෙන දෙන්නක් විය.**

ගුවන්තොටුපළටත් ගියේ. මේ සිදුවීම පාලිත කල්පනා සගරාවට ලිව්වා "තහනම් ගහේ ගෙඩි කෑ බන්දුල වර්ණපුර සහ පිරිස" යන සිරස්තලයෙන්.

පාලිතගේ කරුමෙට මේ මැගසින් එක පිටවෙලා, 1984 මාර්තු මාසයෙ නවසීලන්තය සමග ටෙස්ට් තරගයක් තිබ්බා නුවර අස්ගිරිය ක්‍රීඩාංගණයේ. පාලි ගුවන් විදුලියෙ විස්තර විචාරකයා. මේ තරගය ශ්‍රී ලංකාව දවසක් ඉතිරිව තිබියදි අන්ත ලෙස පැරදුනා. මේ පරාජයෙන් කුපිත වූ මිනිස්සු හූ කියල ගල් මුල් ගහල මහ විනාශයක් කරන්න ගියා. පස්සෙ පොලිස් ආරක්ෂාව මැද කණ්ඩායම ක්‍රීඩාංගණයෙන් එළියට ගෙනිච්චා. මේ සිදුවීම ඇවිස්සුවෙ පාලිත තමයි. එයාගෙ විස්තර විචාරයෙන් ප්‍රේක්ෂකයන්ව උසි ගැන්වුවා. කල් යල් බලා සමහරු පෙට්‍රෝල් දැම්මා. ඊට මාසයකට කලින් කල්පනා සගරාවෙත් සිදුවීම ලියල තිබ්බා කියලා කට්ටියක් පාලිතගේ කරපිට තබා මේ සිදුවීමට දෙහි කැපුවා. වරද බලෙන් පැටෙව්වා. ගාමිණී දිසානායකගෙ ගමත් නුවර හින්ද ඒක එයාගෙ අභිමානයටත් ප්‍රශ්නයක් වුනාලූ .ඒක නිසා සීඅයිඩී එකෙන් කුරුඳුවත්ත පොලිසිය හරහා පාලිතට හතරවැනි තට්ටුවට එන්න කිව්වා. "මම වරදක් කළේ නැති නිසා ගියේ නැහැ. පස්සෙ ආයිත් එන්න කිව්වහම මම ගියා"

පොලිසියට ගියාම ලියුමක් දුන්නා, අහවල් දවසෙ හතරවැනි තට්ටුවට එන්න කියලා. 1984 අප්‍රේල් 19 වැනිදා සෙල්වකුමාර පොලිස් පරීක්ෂක තුමා ඉදිරියේදි මම කට උත්තර දුන්නා. ඔහු ක්‍රිකට් ක්‍රීඩකයකු පමණක් නොව මගේ ක්‍රිකට් විචාරක රසිකයෙක්. එයා කිව්වා ඇමැතිතුමා තමයි අපිට කිව්වෙ මේ සිදුවීම ලියන්න සල්ලි අරන් තියෙනවද කියල පරීක්ෂා කරන්න කියලා.

ඊට පස්සෙ පාලි එයාට කිව්වා "මම හිගා කෑවත් ඒ වගේ ජරා වැඩක් කරන මිනිහෙක් නෙමෙයි" කියල ලියා ගන්නල කියලා. මගේ මාධ්‍ය ජීවිතයේදී කෙනෙක් ඇසූ ජරාම ප්‍රශ්නය මේකයි කියලත් කිව්වා. මම කියන දේ ලියා ගන්නෙ නැතිව සෙල්වකුමාර මා දිහා බලාගෙන හිටියා. ඒ පාර මම කිව්වා ඕක ලියන්න කියලා. ඒ පාර සෙල්වා කිව්වා මේක ඇමැතිතුමා බලනව කියලා. මම ආයිත් කිව්වා බැලූවට කමක් නැහැ ලියන්න කියලා. ඊට පස්සෙ කොහොම හරි මට ආයිත් හතරවැනි තට්ටුවෙන් පහළට බැහැල ගෙදර යන්න පුළුවන් වුණා. ඒත් ටික දවසකින් මට ආයිත් මේ සිදුවීමට හතරවැනි තට්ටුවට යන්න වුණා. බොහෝ හතර වැනි තට්ටුවට ගිය අය නාව අවස්ථා එමටයි.

පාලිත පෙරේරා යනු මහත්වරුන්ගේ ක්‍රිකට් ක්‍රීඩාවට උපන් සැබෑ මහත්මයෙකි. අකුරට වැඩ කරන්න පුරුදුව සිටි ඔහුට නූලට සියල්ල අවශ්‍යය. එබැවින් ඕනෑවට වැඩිය අකුරට වැඩ කිරීම සිය පවුල් ජීවිතයද අවුල් විය හැකි යෑයි ඔහුගේ මිතුරකු මීට දශක ගණනාවකට පෙර පාලිතට පවසා ඇත. ඒ පාලිත ය.

මගේ මතකයට අනුව එදා අපි ක්‍රිකට් තරගයක් රූපවාහිනියෙන් නරඹන විට එහි හඬ නවත්වා පාලිත පෙරේරාගේ කට හඬ ගුවන් විදුලියෙන් අසා තරගයේ උපරිම ආශ්වාදය වින්දෙමු. ඒ තරමට ඔහුගේ ක්‍රිකට් විචාරය අපේ හදවතට දෝංකාර ගෙන දෙන්නක් විය. අසමසම ලෙස ලෙන්ගතු විය. සමීප විය. එහෙත් අද තාක්ෂණය දියුණු වුවද තවත් පාලිත පෙරේරලා බිහි නොවනු ඇත. එදා ඔවුන් ක්‍රිකට් වෙනුවෙන් කළ යුද්ධය අද කිසිවකුටත් කළ නොහැක. අද ක්‍රිකට් යනු මුදල් උල්පතකි. ගණු දෙනු ඩොලර් මිලියන ගණනි. එහෙත් පාලිත පෙරේරා තවමත් බසයෙන් සිය වැඩ රාජකාරිවලට පිටත්ව යයි. ඒ ඔහු ක්‍රිකට් වෙනුවෙන් මුදල් පසු පස හඹා නොගොස් සිය ශ්‍රමය සහ දහඩිය කැප කරමින් අදත් ක්‍රිකට් වෙනුවෙන් වැඩි කාලයක් ගෙවා දමන හෙයිනි. අවුරුදු 54 ක් පුරා ක්‍රිකට් වෙනුවෙන් උපරිමය වැය කළ මොහුට අදටත් ඔහුගේම කියා ලැප්පොට් පරිගණකයක්වත් නොමැති තරම්ය. එහෙත් ඔහු අදත් සුපුරුදු පරිදි ක්‍රිකට් විස්තර විචාරයේ යෙදෙයි. සිය ක්‍රිකට් දිවියේ කිසිදු දිනක රූපවාහිනිය බලා විස්තර විචාරය නොකළ මේ අපූරු මිනිසාගේ ඈත අතීතය ඔහුගේ වදන් වලට අනුව එසේ සටහන් කරමි.

එහෙත් අද සුන්දර මිනිසකු ලෙස පාලිත පෙරේරා යන නාමය පතුරා අවසන්ය. ඔහු කළ මෙහෙවර ඊළඟ යුගයේ කවුරු කරනු ඇතිද? පාලිතට මෙන් සුන්දර අතීතයක් තවත් පරම්පරාවකට ඉදිරියේදී අත්විඳින්ට ලැබේවිද? කෙසේ වෙතත් පාලිත පෙරේරා යනු මෙරට ක්‍රිකට් වෙනුවෙන් තිරය පිටුපස සිට දැවැන්ත මෙහෙයක් කළ ගුවන් විදුලියේ ක්‍රිකට් කොමසාරිස් යයි මට සිතේ.

මොකද පාලිත දැන් නැත්තේ පේන්න. මග තොටේ සැවොම අසන පැනයකි. ඔහු ඔස්ට්‍රේලියාවේද සමහරු අසති. රේඩියෝ සහ රූපවාහිනි නාලිකා 50කට අධික ප්‍රමාණයක් ඇති රටේ පාලිතලා ගැන මාධ්‍ය අසාත්මිකතාව පිළිකුල් ය. වණික්පථිය හිසලා නොගත් පාලිත ජනයාගේ හද ගැස්ම සහ යාවත්කාලීන අවබෝධය තුල ගුවන් තලයේ සැරිසැරූ රසවතෙකි. හුදී ජනයා අතර පාලිත යනු ගුවන් විදුලියේ හිටපු ක්‍රිකට් කොමසාරිස් හෙවත් සර් පාලිත පෙරේරාමය......

හිතවතුනි, ඔබට කතා කල මා පාලිත පෙරේරා( සුබ දවසක්

FREE QUOTE
Custom Built Kitchens for Affordable Prices



- NEW KITCHEN OR RENOVATE OLD ONE
- WARDROBE
- PANTRY
- NEW OVER HEAD CUPBOARDS FOR LAUNDRY



Auska ROUTING PTY LTD
CONTACT
LEELANANDA GALAPPATHTHI 0429 183 974
Fact. 10, 3-11 Bate Close
Pakenham VIC 3810
Ph: 03 5940 4629
Info@auskarouting.com.au
www.auskarouting.com.au

Alpha Academy 2017
Glen Waverley Classes

Grade 8 , 9 - Mathematics
Grade 8 , 9 - Science
Grade 8 ,9 - English
VCE Chemistry 1 , 2
VCE Biology 1 , 2
Other subjects - Upon request

- All students will be tested before enrolment , placed accordingly in the groups
- Unit Tests for all subjects
- VCE , SAC preparation guidance
- Ongoing updates for parents
- Multiple classes during week , enabling catch-up classes

To request an application, please text student name, Class and school to
0457908918

FOR ALL YOUR TRANSLATIONS
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

( ENGLISH SINHALESE)
Documents for immigration purposes

- BIRTH , MARRIAGE, DEATH
- EDUCATIONAL/ VOCATIONAL
- LEGAL and POLICE DOCUMENTS
- NATIONAL IDENTITY CARDS

CONTACT
DR. PREMA KUDALIGAMA
( BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)

Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com